ශීර්ෂය 268 - කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

-----------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක. 271/2019 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුව තිබුණද, එම අවශ්‍යතාවයට අනුකූල නොවන අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට අනුව, ජංගම නොවන වත්කම්වල ශේෂය රු.1,265,867,150 ක් විය. භාණ්ඩාගාර පොත අනුව ශේෂය රු.1,264,194,405 ක් විය. මූල්‍ය කාර්ය සාධනය ප්‍රකාශය සහ භාණ්ඩාගාර පොත අතර වෙනස රු.1,672,745 ක් විය. | සිගාස් පැකේජයේ ශේෂය නිවැරදිය. මේ සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස්කම් කිරීමට භාණ්ඩාගාරයෙන් ඉල්ලා ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීමේදී සියලු ශේෂයන් අනුකූල විය යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ආදායම් රැස්කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **එකතුව**<br>මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ (ACA-F) පෙන්වා ඇති පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක.271/2019 හි 7 (ii) ඡේදයට පටහැනිව, රැස්කිරීමේ අරමුදල් ලෙස භාණ්ඩාගාරයෙන් ලැබෙන ආදායම් ගණන්දීමේ නිලධාරියා වෙනුවෙන් ආදායම් එකතු කරන | මූල්‍ය ප්‍රකාශය සකස් කිරීමේදී අදාළ ACA-3 ආකෘතියෙහි දක්වා නොතිබුණි. අනාගතයේදී මෙවැනි වැරදි සිදු නොවනු | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුව මූල්‍ය ප්‍රකාශය සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| වෙනත් දෙපාර්තමේන්තු වලින් රැස් කරගත් සමස්ථ ආදායම් සැළකීමේදී රු.111,719,283 ක් ACA-3 ආකෘතියෙහි ඇතුළත් කර නොතිබුණි. | ඇත. | |

(ආ) **පුනරාවර්තන වියදම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| වගකීම් සහ බැදීම් සහ ශුද්ධ ප්‍රතිපාදන පිළිබඳ පුනරාවර්තන වියදම් ප්‍රකාශය යටතේ වැය විෂයයන් 02 ක් සමඟ සැසදීමේදී, ශුද්ධ ප්‍රතිපාදන අතිරික්තය වූ රු.218,317 ක් වගකීම් සහ බැදීම් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට පියවර ගනිමින් පවතී. | ප්‍රතිපාදන අනුව වියදම් කළ යුතුය. |

(ඇ) **ප්‍රාග්ධන වියදම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ප්‍රාග්ධන වැය විෂයන් 05 ක සමස්ථ ශුද්ධ ප්‍රතිපාදනය රු.184,100,000 ක් සහ සමස්ථ වියදම රු.23,209,468 ක් වීම නිසා ප්‍රාග්ධන වියදම් ඉතිරිය රු.160,890,532 ක් විය. මෙම ඉතිරිවීම අග්‍රිම හිඟයකට හේතු විය. | භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් අරමුදල් නොලැබීම ඉතිරියට හේතු විය. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුව පියවර ගත යුතුය. |

(ඈ) **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කරන ලද සැසඳුම් ප්‍රකාශයට අනුව ඉල්ලා අස්වූ, සේවයෙන් පහකළ සහ විශ්‍රාමික නිලධාරීන්ට අයත් වසර 10 කට වැඩි කාලයක සිට හිඟහිටි රු.644,195 ක ශේෂයක් සම්බන්ධයෙන් මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | කපාහැරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට ලේඛණ යවා ඇත. | හිඟ මුදල අය කර ගැනීමට පියවර ගත යුතුය. |

(ඉ) **තැන්පතු**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ** | **නිර්දේශය** |
|---|---|---|

| | | අදහස් දැක්වීම | |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව වසර දෙකකට වැඩි කාලයක් ඉක්මවූ රු.5,424,688 ක් වටිනා තැන්පතු සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඒවා නියමිත අයිතිකරුවන්ට ලබා දීමට හෝ රාජ්‍ය ආදායම් ගිණුමට මාරු කිරීමට පියවර ගනිමින් පවතී. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 2015 දී පච්චයිලෙයිපල්ලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජාතික ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ඉඩම් මිලදී ගැනීමට ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ලබා දී තිබුණු රු.2,151,030 ක මුදල පසුගිය වසර 4 ක කාලය තුළ නිසි අරමුණු සඳහා භාවිතා කර නොතිබුණු අතර වර්ෂය අවසානය දක්වා තැන්පතු ගිණුමේ තබා තිබුණි. | ජනවාරි මාසය තුල ගෙවීම් කර ඇත. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ඊ) **සාක්ෂි නොවීම**

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ගෙවියයුතු ලෙස දක්වා තිබුණු ක්‍රියාත්මක ප්‍රාග්ධන ව්‍යාපෘතිවල වැඩ නිමකිරීමේ නියෝගය, කාර්යසාධන වාර්තාව, බිල්පත් ආදිය විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. ප්‍රාග්ධන වැඩ 03 ක් සඳහා ගෙවීම් වටිනාකම වූ රු.13,939,386 ක් විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි විය. | ඉදිකිරීම් කටයුතු 02 ක් සඳහා ගෙවීම් කර ඇත. ඉතිරි ගෙවීම් ලබා දීමට කටයුතු කරමින් පවතී. | වියදම් වවුචර් සහ ඇමුණුම් විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ii) | රිසිට්පත, ගෙවීම්වලට අදාල ගිවිසුම සහ ගෙවීමේ අරමුණ සඳහන් නොකිරීම නිසා පච්චයිලෙයිපල්ලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවන ලද රු.3,428,251 ක් විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි විය. | සියලුම වැරදි සකස් කර ඇත. එවැනි වැරදි අනාගතයේදී නැවත සිදු නොවනු ඇත. | ගෙවීම් සඳහා විගණන සාක්ෂි අමුණා තිබිය යුතුය. |

(උ) **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් අවස්ථා විශ්ලේෂණය කර පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** | | |
| | | රු. | | | |
| (i) | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය.<br>3.2(iv) වගන්තිය | 2,000,000 | උප කොන්ත්‍රාත්තු ප්‍රදානය නොකළයුතු බව ප්‍රජා මූලික සංවිධාන සඳහා සෘජුවම කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ යෝජනා ක්‍රමයේ සඳහන් වුවද කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිරුවයාරු ක්‍රීඩා පිටිය මාර්ග ව්‍යාපෘතිය තිරුවයාරු ග්‍රාම සංවර්ධන සංගමය විසින් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට ලබාදී තිබුණි. | උප ගිවිසුම සම්බන්ධ කිසිදු ලියවිල්ලක් හමු නොවූ බව ග්‍රාම සංවර්ධන නිලධාරියා පවසා තිබුණි. | උප කොන්ත්‍රාත් ප්‍රදානය සම්බන්ධ අදාළ සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කරන ලෙසත් චක්‍රලේඛයට අනුව කටයුතු කරන ලෙසත් ඔවුන්ට දන්වා ඇත. |
| (ii) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය<br>(iv) හා (v) වගන්ති | 28,293 | පච්චයිලෙයිපල්ලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඇඟිලි සලකුණු ලියාපදිංචි කිරීමකින් තොරව නිවාඩු දින වැටුප් ගෙවීම් සිදුකර තිබුණි. | ඉදිරියේදී තවත් එවැනි වැරදි සිදුනොවනු ඇත. | චක්‍රලේඛයට අනුකූලව ක්‍රියා කළ යුතුය. |
| (iii) | ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය.<br>XIX පරිච්ඡේදයේ 5.8 වගන්තිය | 52,000 | උපයෝගිතා නිලධාරියාගේ නිල නිවාසේ විදුලි බිල්පත නිලධාරීන් විසින් ගෙවිය යුතු නමුත් හිඟ විදුලි බිල දිස්ත්‍රික් ලේකම් කාර්යාල අරමුදලින් ගෙවා තිබුණි. | අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට පියවර ගෙන ඇත. | ආයතන සංග්‍රහයට අනුව හිඟ විදුලි බිල්පත අදාළ නිලධාරියාගෙන් අයකර ගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iv) | 2007 ජනවාරි 02 දිනැති ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ මාර්ගෝපදේශය<br><br>පොදු කොන්දේසි 01 හි 11.1, 11.3 හා 11.4 වගන්ති | 368,929 | පල්ලිකුඩා වලර්මති වරාය සඳහා කොන්ත්‍රාත් ගෙවීම් සිදුකිරීමේදී සියයට 20 ක් වූ නිම නොකළ කොන්ත්‍රාත් වැඩ සඳහා අඩුකිරීමෙන් තොරව ගෙවීම් සිදුකර තිබුණි. | අනාගතයේදී වැඩ අවසන් නොකිරීම හේතුවෙන් සිදුවන මූල්‍ය අලාභ ගණනය කිරීමට හා අඩු කිරීමට පියවර ගනු ලැබේ. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |

**(උ) අවිධිමත් ගණුදෙනු**

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | --------------------------------- | ------------- |
| (i) | මුදල් රෙගුලාසි 137 ට අනුව, පච්චයිලෙයිපල්ලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.120,000 ක ගෙවීම් සඳහා නිසි අනුමැතිය ලබා දී නොතිබුණි. | අනුමැතිය ලබාගෙන ඇත. | මූල්‍ය රෙගුලාසි 137 ට අනුව, ගෙවීම් කිරීමට පෙර අනුමැතිය ලබා ගත යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 138 ට අනුව, පච්චයිලෙයිපල්ලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.35,000 ක ගෙවීම් වවුචර් සහතික කර නොමැත. | දිවුරුම් ප්‍රකාශයක් මගින් තහවුරු කර ඇත. | මුදල් රෙගුලාසි 138 ට අනුව, ගෙවීම් කිරීමට පෙර සහතික කිරීම සිදුකළ යුතුය. |

**2. මූල්‍ය කළමනාකරණය**

--------------------------

**2.1 අග්‍රිම කළමනාකරණය**

--------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ----------------------------- | ------------- |
| සමාලෝචිත වර්ෂය තුළ දිස්ත්‍රික් මහලේකම් කාර්යාලය විසින් රු.6,582,938 ක අග්‍රිම ඉල්ලා තිබුණු නමුත් රු.2,240,660,000 ක් පමණක් ලැබී තිබුණි. මුදල් වර්ෂය තුළ | මුදල් වර්ෂය තුළ අග්‍රිම හිඟය හේතුවෙන් තොග ලැබීම් වගකීම් තුළ දක්වා තිබුණි. | අග්‍රිම නිසි ලෙස සැලසුම් කර නියමිත වේලාවට ලබාගැනීමට පියවර ගත යුතුය. |

රු.1,343,731,000 ක් ලැබී නොතිබුණි. මේ අනුව නිමකරන ලද ප්‍රාග්ධන වැඩ සඳහා ගෙවීම් කිරීමට නොහැකි වීම නිසා බැදීම් සහ බැරකම් ගිණුම්වල රු.15,460,013 ක අතිරේඛ අගයක් දැක්වුණි.

## 2.2 බැංකු ගිණුම් පවත්වාගෙනයාම

බැංකු ගිණුම් පවත්වාගෙන යාම පිළිබඳව සිදුකළ නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කන්දවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම වෙනුවෙන් ගෙවියයුතු රු. 8,757,467 ක් වටිනා චෙක්පත් දෙකක් පසුගිය වසර 03 ක කාලයක් තුළ ගෙවා නොමැති අතර වර්ෂය අවසානය දක්වා නිශ්කාශණය නොවූ චෙක්පත් ලෙස පැවතුණි. | රජයේ ආදායම් ගිණුමට 2020 පෙබරවාරි මාසය තුලදී මාරුකර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන වියදම් කිරීම

නැවත පදිංචි කිරීම්, පුනරුත්ථාපන, උතුරු ප්‍රදේශ සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ අරමුදල් යටතේ ක්‍රියාත්මක කරන ලද නිෂ්පාදන සමුපකාර ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද ව්‍යාපෘති සමාලෝචනය කිරීමේදී පහත සඳහන් නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **භාවිතයට නොගැනීම/ ව්‍යාපෘති වත්කම්වල අකාර්යක්ෂමතාව**<br>විවිධ සේවා සමුපකාර සමිති 04 කට ලබා දී තිබුණු රු.28,756,571 ක් වූ ගොඩනැගිලි සහ උපකරණ පසුගිය වසර 01 සිට 02 කට වැඩි කාලයක් අදාළ කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි. | නිෂ්පාදන පහසුකම් ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරෙන්නේ අදාළ විවිධසේවා සමුපකාර සමිතිවලටය. මෙය අදාළ අයගේ අවධානයට යොමු කර ඇත. | භාවිතයට පියවර ගත යුතුය. |
| (ආ) කරච්චි උතුර විවිධසේවා සමුපකාර සහල් මෝල් ගොඩනැගිලි පුනරුත්ථාපන ලංසු සටහන් අංක 09 සහ 12, ලංසු දැන්වීම් ලේඛන, තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටු තීරණවල දක්වා ඇති | අයිතම 9, 12 යනු සංරචකයේ මිලෙහි ඇතුළත් අයිතමයේ මිල වේ. එබැවින් මෙම ගෙවීම සිදු කරනු ලැබේ. | වැඩිපුර ගෙවීම ගණනය කර වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වටිනාකමට වඩා රු.350,000 ක වැඩි අගයකට ප්‍රදානය කර තිබුණි. | | |
| (ඇ) | කරච්චි උතුරු විවිධසේවා සමුපකාර සමිතියේ සහල් මෝල ක්‍රියාත්මක කිරීම සඳහා රු.2,001,500 ක් වටිනා යන්ත්‍රෝපකරණ මිලදී ගෙන ලබාදී වසර 02 කට අධික කාලයක් ගතව ඇති නමුත් යටිතල පහසුකම් ඇතිකර නොමැති අතර උපකරණ භාවිතා කර නොතිබුණි. | යන්ත්‍රය සහ විදුලි සම්බන්ධතාවය සඳහා අවශ්‍ය අතිරේක අවශ්‍යතා අදාළ සමිතිය විසින් සපයනු ඇතැයි යන පදනම මත මෙම ව්‍යාපෘතියට අරමුදල් සපයන ලදී. | මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී යටිතල පහසුකම් සම්බන්ධයෙන් සලකා බැලිය යුතු අතර සහල් මෝල ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | සැපයුම් කාල සීමාව ඉකුත්වී මාස 04 ක් ගතව ඇතත් රු.1,468,000 ක් වටිනා පොල් වියළීමේ යන්ත්‍රයක් පච්චයිලෙයිපල්ලි විවිධසේවා සමුපකාර සමිතියට සැපයුම්කරු විසින් ලබා දී නොමැත. | හැකි ඉක්මනින් සැපයුම සම්පූර්ණ කරන ලෙස සැපයුම්කරුවන ISF ආයතනයට උපදෙස් ලබාදී ඇත. | කොන්ත්‍රාත් ගිවිසුමට අනුව කඩිනමින් පියවර ගත යුතුය. |
| (ඉ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තිය අනුව භාණ්ඩ මිලදී ගැනීමේදී සියයට 10 ක වටිනාකමින් යුත් කාර්යසාධන ඇපකරයක් ලැබිය යුතු වුවත් උපකරණ මිලදී ගැනීමේදී සියයට 5 ක ප්‍රතිශතයකට සමාන රු.552,574 ක කාර්යසාධන ඇපකරයක් පමණක් ලැබී තිබුණි. | සියයට 10 ක කාර්යසාධන ඇපකරයක් ලබාගැනීමට ඉදිරියේදී පියවර ගත යුතුය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඊ) | පච්චයිලෙයිපල්ලි විවිධසේවා සමුපකාර සමිති තෙල් නිෂ්පාදන කම්හල් ව්‍යාපෘති යෝජනාව ප්‍රකාරව යන්ත්‍ර හා උපකරණ ව්‍යාපෘති වියදමින් දැරීමට සමිතිය විසින් ඉල්ලා නැතත් පිරිවැය රු.1,837,500 ක් වූ යන්ත්‍රෝපකරණ මිලදී ගෙන සපයා ඇති අතර එම යන්ත්‍ර හා උපකරණ අනවශ්‍ය මෙන්ම භාවිතයට ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | මෙම ප්‍රසම්පාදන ඇණවුමට ඇතුළත් අයිතම ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ සැපයුම් තීරණය ලබාගැනීමට පෙර සපයා තිබුණු අයිතම් බව වාර්තා විය. | වගකිවයුතු නිලධාරියා විසින් සුදුසු පියවර ගත යුතු අතර උපකරණ භාවිතා කිරීමට වහාම පියවර ගත යුතුය. |
| (උ) | නිෂ්පාදන සමුපකාර ව්‍යාපෘතිය හරහා කරච්චි, පච්චයිලෙයිපල්ලි, කරච්චි දකුණ සහ කිලිනොච්චි දිස්ත්‍රික් විවිධසේවා සමුපකාර සමිතිවලට සහල් මෝල්, තෙල් | ප්‍රසම්පාදිත භාණ්ඩ සඳහා වගකීම් සහතික සහ මාර්ගෝපදේශ සැපයුම්කරුවන්ගෙන් ලබාගෙන නිකුත් කර ඇත. තවද යම් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව වහාම පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| මෝල් සහ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා වටිනාකම රු.15,043,033 ක් වූ උපකරණ මිලදී ගෙන ලබාදී තිබුණි. 2006 වර්ෂයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.3 (ඇ) වගන්තිය අනුව, උපකරණ සහ භාණ්ඩ සඳහා වගකිවයුතු නිලධාරියෙකු විසින් වගකීම් සහතික, සුරක්ෂණ සහ අත්පොත් සපයා නොතිබුණි. | ක්‍රියාමාර්ග ගෙන තිබේ. | |
| (ඍ) 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ 23 (අ) වගන්තිය යටතේ (අ) නියෝගය සහ 2008 ජනවාරි 25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක. 1533/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව පාරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගෙන නොතිබුණි. කාබනික පොහොර නිෂ්පාදනය සඳහා රු.6,628,500 ක වියදමින් ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, වාහන මිලදී ගෙන තිබුණු අතර මහජන සෞඛ්‍ය පවා නොසැලකා හරිමින් මීටර් 50 ක් ඇතුළත නේවාසික ප්‍රදේශ ද හමුවිය. | අදාළ බලපත්‍රය ලබා ගැනීමේ ක්‍රියාවලිය මේ වන විට කරච්චි දකුණු විවිධසේවා සමුපකාර සමිතිය විසින් සිදු කරනුලබන අතර පරිසර අධිකාරිය සමඟ සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත. | නීතියට අනුකූලව පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති නිමකිරීමෙන් තොරව අතහැර දැමීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වරාය ගැඹුරු කිරීමේ ව්‍යාපෘතියට අදාළව, ගිවිසුම්ගත කර ඇති රු.4,660,303 ක් වටිනා ව්‍යාපෘති 02 ක උපකරණ නොමැතිකම හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් විසින් අතහැරදමා තිබුණු අතර සිදු කරන ලද වැඩ සඳහා රු .1,650,585 ක් ගෙවා තිබුණි. | විවෘත ටෙන්ඩරයක් හරහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත කොන්ත්‍රාත්කරු තෝරාගෙන ඇත. | නීති හා රෙගුලාසි අනුව පියවර ගත යුතුය. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ **(CIDA)** මාර්ගෝපදේශ අනුව ද පියවර ගත යුතුය. |

## 3.2 ව්‍යාපෘති නිමකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වටිනා රු.14,252,741 ක් වූ ව්‍යාපෘති 3 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2019 දෙසැම්බර් මාසයේදී අවසන් කර ඇතත්, වාර්තා කරන දිනය දක්වා කිසිදු වැඩක් අවසන් කර නොතිබුණි. | වැඩ සැලැසුම් දෙකක සියයට 75 ක වැඩ අවසන් කර ඇත. ඉතිරි වැඩ කටයුතු කරගෙන යනු ලැබේ. | කාර්යසාධන වාර්තාවේ අදාළ තොරතුරු ඇතුළත් කළ යුතුය. |

## 3.3 වෙනත් නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පසුගිය වසරේ කාර්යසාධන වාර්තාවේ දක්වා ඇති වැරදි තොරතුරු හේතුවෙන් 24,114 ක්වූ සමෘර්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2019 දී ඉහළ ගොස් තිබුණි. | දරිද්‍රතාවයෙන් පෙළෙන පවුල් හඳුනාගෙන සැලැස්මට ඇතුළත් කර ඇත. | කාර්යසාධන ප්‍රකාශයට අදාළ තොරතුරු ඇතුළත් කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන

පහත සඳහන් නිරීක්ෂණයන් විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂය සඳහා ජාතික තරහකාරී ටෙන්ඩර් දැන්වීමක් මගින් රු.5,492,500 ක ප්‍රාග්ධන වියදම් යටතේ ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක කිරීමට ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් කළද, කොන්ත්‍රාත්තු ඍජුවම ග්‍රාමීය මට්ටමේ ආයතනවලට ප්‍රදානය කර තිබුණි. | ජාතික තරහකාරී ලංසු තැබීමේ ක්‍රමය හරහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කලද, වැඩසටහන් වටිනාකම හා කාලසීමාව සැලකිල්ලට ගනිමින් ග්‍රාමීය සමාගම් හරහා කොන්ත්‍රාත් කටයුතු සිදු කර ඇත. මේ සම්බන්ධයෙන් අනාගතයේදී සලකා බලනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 දී රු.757,500 ක වියදමින් නිම කරන ලද නිපුණතා සංවර්ධන මධ්‍යස්ථානයේ ළිදේ ඉදිකිරීම් කටයුතු 2019 ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබුණි. | 2018 දී ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන්, ඒ ආකාරයෙන්ම 2019 ප්‍රතිපාදන මගින් ගෙවීම සිදු කරන ලදී. | ප්‍රසම්පාදන සැලැස්මේ අසම්පූර්ණ වැඩ ඊළඟ වසරේ සැලැස්මට ඇතුළත් කළ යුතුය. |
| (ඇ) | ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණික ඇගයීම් කමිටුවේ තීරණයට පටහැනිව විනයගපුරම් ගොවි සමුපකාර සමිතියේ පලතුරු හා එළවළු සැකසුම් කර්මාන්ත ශාලාවට රු.11,595,798 ක් වටිනා වියළන හා ජෙනරේටර උපකරණ බෙදාදී තිබුණි. | තාක්ෂණික සහතිකය තවමත් නිකුත් කර නොමැති බැවින් සමස්ථ ප්‍රසම්පාදනය මේවන තෙක් ඉටුකර නොමැති අතර තාක්ෂණික අවශ්‍යතා තවමත් සම්පූර්ණ කර නොමැත. | තාක්ෂණික ඇගයීම් කමිටුවේ අවශ්‍යතාවයට අනුව යන්ත්‍රෝපකරණ මිලදී ගත යුතුය. |
| (ඈ) | නිෂ්පාදන සමුපකාර ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද මත්ස්‍ය සැකසුම් කම්හල සඳහා රු.මිලියන 9.75 ක් වටිනා මාළු වියළීමේ උපකරණ මිලදී ගෙන තිබුණි. කිලිනොච්චි දිස්ත්‍රික්කයට විදුලි සැපයුම ඇම්පියර් 60 ක් වන අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා ඇම්පියර් 100 ක තෙකලා විදුලි රැහැනක් ඉල්ලා තිබුණි. මිලදීගත් යන්ත්‍රය වසර 01 කට වැඩි කාලයක් අක්‍රියව පැවතුණි. | මූල්‍යමය බාධාවන් හේතුවෙන් කර්මාන්තශාලාව ක්‍රියාත්මක කිරීම සඳහා සංගමයේ අවශ්‍යතාවය පරිදි විදුලිබල මණ්ඩලයෙන් වෙනම වෙළඳ ජාලයන් ඉල්ලා ඇත. | යටිතල පහසුකම් සලකා බලා භාණ්ඩ මිලදී ගැනීමට පියවර ගත යුතු අතර යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |

**3.5 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ----------------------------- | ------------- |
| (අ) | පානීය ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා 2019 පෙබරවාරි මාසයේදී කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද **WP LO -** 2978 ජල ටැංකිය සහ ලොරි බවුසරය වසර 01 ක කාලයන් භාවිතා කර නොතිබුණි. | වාහනය භාවිතා කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි. කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහන නැවැත්වීමේ ඉඩ පහසුකම් නොමැත. | භාවිතයට පියවර ගත යුතුය. |
| (ආ) | ලෝක ආහාර ව්‍යාපෘතිය යටතේ පරිත්‍යාග කරන ලද මෝටර් වාහන 05 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගබඩාවේ තිබුණු නමුත් මෝටර් රථ 05 හි හිමිකාරීත්වය වසර 03 | පියවර හැකි ඉක්මනින් සාකච්ඡා කරනු ලැබේ. | අයිතිය පැවරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක් තිස්සේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පවරාගෙන නොතිබුණි. | | |
| (ඇ) | නියඟයට ජලය සැපයීම සඳහා 2018 දී වාරිමාර්ග, ජල සම්පාදන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් පරිත්‍යාග කර තිබුණු ලීටර් 1000 ක ධාරිතාවයකින් යුත් ජල ටැංකි 50 ක් සහ පරිත්‍යාග කරන ලද ජල පෙරන 40 ක් වසරකට වැඩි කාලයක් භාවිතා කර නොතිබුණි. | අවශ්‍ය පරිදි ප්‍රමුඛතා පදනමින් බෙදා හරින අතර පෙරන යන්ත්‍ර සතියක් ඇතුළත ලබා දෙනු ඇත. | භාවිතයට පියවර ගත යුතුය. |

## 3.6 පාඩු හා හානි

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදු කරන ලද ව්‍යාපෘති 05 ක් කොන්ත්‍රාත් කාලය තුළ අවසන් කර නොතිබුණද**,** ප්‍රමාද ගාස්තු සඳහා ගෙවිය යුතු රු.956,911 ක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර නොතිබුණි. | මාර්ගය පුනරුත්ථාපනය කිරීමට කටයුතු කර ඇති අතර මුහුද ගැඹුරු කිරීම සඳහා උපකරණ නොමැතිවීම හේතුවෙන් කොන්ත්‍රාත් කාලය තුළ වැඩ නිම කිරීමට නොහැකි විය. | කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ප්‍රමාද සඳහා දඩ මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2012 සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ තිබුණු වාහන 05 ක් හදිසි අනතුරු වලට ලක්වූ අතර රු.2,816,237 ක් වූ එම වටිනාකමින් රක්ෂණ වන්දි ලෙස රු.1,194,675 ක් පමණක් ලැබී තිබුණි. රු.1,621,562 ක් වූ මූල්‍ය අලාභය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අංක. 104 (4) අනුව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර සමාලෝචිත මූල්‍ය ප්‍රකාශනවල කිසිදු අලාභයක් පෙන්නුම් කරද නොතිබුණි. | අඛණ්ඩව පියවර ගනිමින් පවතී. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

## 3.7 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වී මිලදී ගැනීම සඳහා කිලිනොච්චි දිස්ත්‍රික්කයේ විවිධසේවා සමුපකාර සමිති 03 ක් සඳහා නිකුත් කළ රු.මිලියන 3.42 ක අත්තිකාරම් වසර 7 කට වැඩි කාලයක් තුල පියවා නොතිබුණි. | මාසිකව ගෙවීම් සම්පූර්ණ කිරීමට උපදෙස් දී ඇත. | හිඟ අත්තිකාරම් මුදල් පියවා ගැනීමට වහාම පියවර ගත යුතුය. |
| (ආ) | කන්දවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු බේරුම්කරණයක් සඳහා සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.220,875 ක් ගෙවා තිබුණි. බේරුම්කරණය අවසන් කර නොමැති බැවින් වසර 03 ක් සඳහා කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු රු.8,236,594 ක් 2020 පෙබරවාරි 17 දින ආදායමක් ලෙස රාජ්‍ය ආදායම් ශීර්ෂයට මාරු කර තිබුණි. | බේරුම්කරණය සඳහා වූ නඩුව ප්‍රමාද වීම හේතුවෙන් වෙක්පත් රාජ්‍ය ආදායම් ගිණුමට මාරු කර ඇත. | බේරුම්කරණයට අනුකූලව පියවර ගත යුතුය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් හඳුනාගෙන ඇති තිරසර සංවර්ධන ඉලක්ක 2020 අප්‍රේල් 30 වන තෙක් සකස් කර නොතිබුණි. | මේ වනවිට සකස්කර ඇත. | සුදුසු තිරසර සංවර්ධන අරමුණු සකස් කළ යුතුය. |

## 5. යහපාලනය

## 5.1 මහජනයාට සේවාවන් ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් සමෘද්ධි ප්‍රජා මූල බැංකුවේ 2017 අප්‍රේල් 07 දිනැති අංක 2017/5 දරන චක්‍රලේඛය අනුව බැංකු සාමාජිකයන් සඳහා තෑගිදීමට රු.662,194 ක වියදමින් මිලදීගෙන තිබුණු එල්පී ගෑස් සිලින්ඩර් 66 ක් සහ වවුචර් 116 ක් ප්‍රතිලාභීන්ට ලබා නොදී නිලධාරීන් විසින්ම ලබාගෙන තිබුණි. | නැවත ලබාගැනීමට පියවර ගෙන තිබේ. | ආයතන සංග්‍රහය ප්‍රකාරව පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ 2019 වර්ෂයේ අවස්ථා 02 කදී අභියාචනා කරන ලද තොරතුරු සඳහා 2020 මැයි 22 වන දින දක්වා කිසිදු අභියාචනා වාර්තාවක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගොනු කර නොතිබුණි. | තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ප්‍රකාරව අභියාචනාකරුවන්ට තොරතුරු ලබා දී ඇත. | නීතියට අනුකූලව පියවර ගත යුතුය. |

## 6. **මානව සම්පත් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2001 අගෝස්තු 22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 18/2001 ට අනුව සෑම සේවා ස්ථානයකම උපරිම සේවා කාලය අවුරුදු 05 කි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවය කරන නිලධාරීන් 46 දෙනෙකු එකම සේවා ස්ථානයේ වසර 06 සිට 21 ක් දක්වා අඛණ්ඩව රාජකාරියේ යෙදී සිටිති. | පියවර ගනිමින් සිටී. | චක්‍රලේඛය ප්‍රකාරව පියවර ගත යුතුය. |
| (ආ) | පුරප්පාඩු 76 ක් සඳහා බඳවාගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | පියවර ගනිමින් සිටී. | පුරප්පාඩු පිරවීමට පියවර ගත යුතුය. |